// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2261/50 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2013 (ii)

### 1971 අංක 52 දරන වෙළඳ නැව්පනත

1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ 139 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 321 වැනි වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රෝහිත අබේගුණවර්ධන,**
වරාය හා නාවික අමාත්‍ය.

2021 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. (1) මේ නියෝග 2021 අංක 02 දරන වෙළෙඳ නැව් (ඉදි කිරීමේ ආකෘතිය, අනු බෙදීම සහ ස්ථායීතාවය, යන්ත්‍ර සූත්‍ර සහ විද්‍යුත් සවි කිරීම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ II-1 වන පරිච්ඡේදය, කලින් කලට සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන සංශෝධන බලාත්මක කිරීම මේ නියෝගයන්හි කාර්යය විය යුතු ය.

### I වන කොටස

*මේ නියෝගවල අදාළත්වය*

2. (1) මේ නියෝගයේ (2) වන, (3) වන, (4)වන සහ (5) වන උපනියෝගවල විධිවිධානයන්ට යටත්ව මේ නියෝග, ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති ජාත්‍යන්තර මුහුදු ගමන්හි නිරතවන නැව් සඳහා සහ ශ්‍රී ලංකා ජල තීරයෙහි ගමන් කරන වෙනත් යම් විදේශීය නැව් සඳහා අදාළ විය යුතු ය.

(2) (මේ නියෝගයන්හි "සම්මුතිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය, 1988 ප්‍රොටොකෝලයේ, අන්‍යාකාරයෙන් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ නියෝග -

(අ) යුධ නැව් සහ හමුදා පිරිස් ගෙන යන නැව් සඳහා;

(ආ) දළ ටොන් බර 500ට අඩු භාණ්ඩ නැව් සඳහා;

(ඇ) යාන්ත්‍රික ක්‍රම මගින් ප්‍රචලනය නොකරන නැව් සඳහා;

(ඈ) ප්‍රාථමික ලෙස ඉදිකළ ලී නැව් සඳහා;

(ඉ) වෙළෙඳාමේ නොයෙදෙන විනෝද යාත්‍රා සඳහා; සහ

(ඊ) ධීවර යාත්‍රා සඳහා,

අදාළ නොවිය යුතු ය.

(3) සම්මුතියේ අන්‍යාකාරයෙන් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර මේ නියෝග, 2009 ජනවාරි මස 01 වැනි දින හෝ ඉන්පසු තොටුතලය තනනු ලැබූ හෝ ඒ හා සමාන අවස්ථාවක තොටුතලය පවතින්නා වූ නැව් සඳහා අදාළ විය යුතු ය.

(4) සම්මුතියේ අන්‍යාකාරයෙන් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, 2009 ජනවාරි මස 01 වන දිනට පෙර ඉදිකරන ලද නැව්, සම්මුතියේ II-1 පරිච්ඡේදයේ 1(2) නියෝගය සමග අනුකූල විය යුතු ය.

(5) සම්මුතියේ V වැනි පරිච්ඡේදයේ ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ නියෝගවල විධිවිධාන, උතුරු ඇමෙරිකාවේ මහා විල්වල සහ කැප් ඩෙස් රොසියර්ස් සිට ඇන්ටිකොස්ටි දූපතේ බටහිර තුඩුව දක්වා අඳිනු ලබන සෘජු රේඛාවක නැගෙනහිරට වන්නට පිහිටි ශාන්ත ලෝරන්ස් ගංගාව හරහා 63 වන දේශාංශයේ ඇන්ටිකොස්ටි දූපතේ උතුරු ප්‍රදේශයේ තනිව යාත්‍රා කරන ශ්‍රී ලාංකික නැව්වලට අදාළ නොවිය යුතු ය.

3. අලුත්වැඩියා කිරීම්, වෙනස් කිරීම් සහ නවීකරණයන් සහ ඒ හා සම්බන්ධ සවි කිරීම් සඳහා භාජනය වන සියලු නැව්, අවම වශයෙන් මේ නැව් සඳහා කලින් අදාළ වූ නියම සමග අඛණ්ඩව අනුකූල විය යුතු ය. එකී නැව්, යම් අදාළ නීතිමය සංශෝධන, බලාත්මකවන දිනට පෙර ඉදිකරනු ලැබුවහොත්, එකී දින හෝ ඉන්පසු තනනු ලැබූ නැව් සඳහා වන නියම සමග, එකී අලුත්වැඩියා කිරීම්, වෙනස් කිරීම්, නවීකරණය කිරීම් හෝ සවි කිරීම් සිදු කිරීමට පෙර ඔවුන්,අවම වශයෙන් ඊට සමාන ප්‍රමාණයකින් හෝ රීතියක් ලෙස, අනුකූල විය යුතු ය. ප්‍රධාන අංගයක අලුත් වැඩියා කිරීම්, වෙනස් කිරීම් සහ නවීකරණයන් සහ ඒ හා සම්බන්ධ සවි කිරීම්, (මේ නියෝගවල "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" ලෙස සඳහන් කරනු ලබන) වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යුක්ති සහගත සහ ප්‍රායෝගික යැයි සලකන තාක්දුරට, නැව් ඉදිකරන ලද දින හෝ යම් අදාළ සංශෝධනයක් ක්‍රියාත්මකවන දින පවතින නැව් සඳහා වන නියමයන්ට අනුකූල විය යුතු ය.

4. (1) සාමාන්‍යයෙන් ජාත්‍යන්තර මුහුදු ගමන්වල නොයෙදෙන, නමුත් විශේෂ අවස්ථානුගත කරුණුවල දී තනි ජාත්‍යන්තර මුහුදු ගමනක් යාම සඳහා නියම කරනු ලබන නැවක්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මේ නියෝගවල සඳහන් යම් නියමවලින් නිදහස් කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ මතය අනුව නැව විසින් සිදු කරනු ලැබිය යුතු මුහුදු ගමන් සඳහා ප්‍රමාණවත් වන ආරක්ෂක නියමයන්ට එකී නැව අනුකූල විය යුතු ය.

(2) අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින්, ජාත්‍යන්තර මුහුදු ගමන් හි යෙදෙන නැව්වල යම් නවීන අංග වැඩි දියුණු කිරීම සම්බන්ධ පර්යේෂණ සහ එම අංග නැවක අන්තර්ගත කිරීම පිළිබඳ පර්යේෂණවලට බරපතල ලෙස බාධාවක් විය හැකි ලෙස අදාළ වන සම්මුතියේ II-2, II-2, III සහ IV වන පරිච්ඡේදවල යම් විධිවිධානවලින් නවීන වර්ගයක අංග අන්තර්ගත වන යම් නැවක් නිදහස් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, නැව මගින් ලබාදීමට අපේක්ෂිත සේවාව ලබාදීම සඳහා ප්‍රමාණවත්වන බවට සහ නැවේ සම්පූර්ණ ආරක්ෂාව පිළිබඳව සහතික කිරීම සඳහා වන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ මතය වන සහ නැව ගමන් කරනු ලබන රාජ්‍යයන්ගේ රජයන් විසින් පිළිගන්නා ලද ආරක්ෂක නියමයන්ට අනුකූලව එකී නැව් කටයුතු සිදු කරනු ලැබිය යුතු ය.

(3) මුහුදු ගමනේ ආරක්ෂිත ස්වභාවය සහ තත්ත්වය, සම්මුතියේ II-1 පරිච්ඡේදයේ වන යම් විශේෂිත නියම අදාළ වීම අයුක්ති සහගත හෝ අනවශ්‍ය බවට පත් කරන පරිද්දෙන් වන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා සලකනු ලබන්නේ නම්, ඔහු විසින් එම නැව්වල මුහුදු ගමන සිදුවන අතරතුර දී ඊට ආසන්නතම භූමියේ සිට සැතපුම් 20කට වඩා දුරින් ගමන් නොකරන තනි ශ්‍රී ලංකා නැව් හෝ ශ්‍රී ලංකා නැව් පන්ති, මෙකී නියමවලින් නිදහස් කරනු ලැබිය හැකි ය.

(4) මේ නියෝගය යටතේ නැවක් නිදහස් කරන අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් (මේ නියෝගයන්හි "සංවිධානය" ලෙස සඳහන් කරනු ලබන)ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය වෙත එහි විස්තර සහ එකී නිදහස් කිරීමට හේතු දැනුම් දිය යුතු ය.

(5) මේ නියෝගවල සඳහන් කරනු ලැබූ නිදහස් කිරීම 2022.01.06 දිනැති අංක 2261/49 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 2021 අංක 01 දරන වෙළඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝගයන්ට අනුකූලව නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) සම්මුතියේ II-1 පරිච්ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි විකල්ප නියම සමග යම් නැවක් අනුකූල වන විටක දී හෝ යම් විධිවිධාන අයුක්ති සහගත හෝ ප්‍රයෝගික නොවන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක දී හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එහි විස්තර කර ඇති ආකාරයේ නැවක් සම්බන්ධයෙන් සම්මුතියේ II-1 පරිච්ඡේදයේ අදාළ නියම අත්හැරිය හැකි ය.

(7) සම්මුතියේ II-1 පරිච්ඡේදය මගින් නියම කරනු ලැබූ අනුමතියක් හෝ ආදර්ශ අනුමතියක්, හෝ සම්මුතියේ II-1 පරිච්ඡේදය මගින් අවසර ලබා දෙනු ලැබූ ඊට සමාන විධිවිධානයක් හෝ අත්හැරීමක්,

(අ) එය ලිඛිතව ඇත්නම්;

(ආ) එය බලාත්මකවන දිනය එහි නිශ්චිතව දක්වා ඇත්නම්; සහ

(ඇ) එහි සඳහන් යම් කොන්දේසීන්ට අනුකූලව කටයුතු කර ඇත්නම්,

පමණක් වලංගු විය යුතු ය.

(8) මේ නියෝග යටතේ ප්‍රදානය කරනු ලැබූ යම් නිදහස් කිරීමක්, අනුමතයක් හෝ අත්හැරීමක්, සාධාරණ දැනුම් දීමකින් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙනස් කිරීම අවලංගු කිරීම කළ හැකි ය.

5. වන්දනාකරුවන් සඳහා වන ව්‍යාපාර වැනි විශේෂ ව්‍යාපාරවලට අයත් මගීන් විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීම සඳහා විශේෂ ව්‍යාපාරයන්හි යොදවනු ලැබූ මගී නැව් සම්බන්ධයෙන් වන විට දී එකී නැව් සම්මුතියේ II-1 පරිච්ඡේදයේ නියම යන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික නොවන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින්, එකී නැව්,

(i) 1971, විශේෂ ව්‍යාපාර මගී නැව් ගිවිසුමට අමුණා ඇති රීති; සහ

(ii) 1973, විශේෂ ව්‍යාපාර මගී නැව් සඳහා වන ඉඩ පහසුකම් අවශ්‍යතා පිළිබඳ ප්‍රොටොකෝලයට අමුණා ඇති රීති, යන විධිවිධාන සමග සම්පූර්ණයෙන් අනුකූලවන්නේ නම් එම නැව් මෙම නියමයන්ගෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

*නැව්වල ව්‍යුහය*

6. සම්මුතියේ විස්තර කරන ලද නැවකට අදාළව එහි II-1 පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට අනුකූලව නැවක් සැලසුම් කිරීම, තැනීම, උපකරණ සවි කිරීම සහ නඩත්තු කිරීම කරනු ලැබිය යුතු අතර ඊට අමතරව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගනු ලැබූ පිළිගත් සංවිධානයක ව්‍යුහමය, යාන්ත්‍රික සහ විද්‍යුත් නියමය සමග අනුකූල විය යුතු ය.

## III වන කොටස

*අනුබෙදීම සහ ස්ථායීතාවය*

7. (1) සම්මුතියේ විස්තර කරන ලද නැවකට අදාළව එහි II-1 පරිච්ඡේදයේ ආ කොටසේ සහ ආ-1 කොටසේ සඳහන් කර ඇති අනුබෙදීම සහ ස්ථායීතාවය පිළිබඳ නියම සමග නැවක් අනුකූල විය යුතු ය.

(2) ප්‍රමාණය නොසලකා සෑම මගී නැවක් ම සහ මීටර 24 ක් හා ඊට වැඩි දිගකින් යුත් සෑම භාණ්ඩ නැවක් ම, එහි නිමාව පිළිබඳ සහ නිශ්චය කරනු ලැබූ එහි ස්ථායිතා මූලිකාංග වෙත යොමු විය යුතු ය. වත්මන් නියෝගයන් හි වෙනත් යම් අදාළ නියමයන්ට අමතරව, අවම වශයෙන් 2010 ජූලි මස 01 වැනි දින හෝ ඉන්පසු තනනු ලැබූ මීටර 24 ක් සහ ඊට වැඩි දිගකින්

යුත් නැව් 2008 IS සංග්‍රහයේ අ කොටසේ නියමයන් සමග අනුකූල විය යුතු ය. 2010 ජූලි මස 1 වැනි දිනට පෙර තනනු ලැබූ නැව් IMO Res. A. MSC. 75 (69) මගින් සංශෝධිත පරිදි IMO Res. A. 749 (18) හි සඳහන් කර ඇති නියමයන් සමග අනුකූල විය යුතු ය.

(3) සම්මුතියේ II-1 පරිච්ඡේදයේ 5-1 නියෝගයේ සඳහන් කර ඇති අදාළ නියමයන්ට අනුකූලව නැවකට අදාළ ස්ථායිතා තොරතුරු නෞකාධිපති වෙත සපයනු ලැබිය යුතු ය. ස්ථායිතා තොරතුරුවල පිටපතක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

8. සම්මුතියේ විස්තර කරන ලද නැවකට අදාළව එහි II-1 පරිච්ඡේදයේ ආ කොටසෙහි සඳහන් කර ඇති අනුබෙදීම, ජල පරිරෝධක සහ කාලගුණ පරිරෝධක ඒකාග්‍රතා නියමයන්ට අනුකූලව නැවක් සැලසුම් කිරීම, තැනීම, උපකරණ සවි කිරීම සහ නඩත්තු කිරීම කරනු ලැබිය යුතු ය.

9. (1) නියම කරන ලද අනුබෙදීම් මට්ටම පවත්වාගෙන යනු ලැබීම සඳහා, අනුමත කරන ලද සටහනට අනුරූපවන්නා වූ පැටවුම් රේඛාවක් වෙන් කරනු ලැබිය යුතු අතර එය මගී නැව්වල නැවේ දෙපස සලකුණු කරනු ලැබිය යුතු ය. විකල්ප මෙහෙයුම් ක්‍රම සඳහා අදහස් කරන ලද මගී නැවක්, අයිතිකරුගේ අභිමතය පරිදි, අනුබෙදීම් සටහන් සමග අනුරූපවීම සඳහා අතිරේක බඩු බර රේඛා එකක් හෝ ඊට වැඩි ගණනක් වෙන් කිරීම හෝ සලකුණු කිරීම කළ හැකි අතර එය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විකල්ප සේවා වින්‍යාසයන් සඳහා අනුමත කළ හැකි ය. එසේ අනුමත කරනු ලැබූ එක් එක් සේවා වින්‍යාසය, වෙනත් මෙහෙයුම් සඳහා ලබාගත් ප්‍රතිඵලවලින් ස්වාධීනව, සම්මුතියේ II-1 පරිච්ඡේදයේ ආ කොටස සමග අනුකූල විය යුතු ය.

(2) වෙන්කර සලකුණු කරනු ලැබූ පැටවුම් රේඛා අනු බෙදීම, මගී නැව් ආරක්ෂක සහතිකයේ සටහන් කරනු ලැබිය යුතු අතර එය ප්‍රධාන මගී සේවා වින්‍යාසය සඳහා P1 සලකුණු කිරීම මගින් සහ විකල්ප වින්‍යාස සඳහා P2, P3 යනාදී වශයෙන් සලකුණු කිරීම මගින් වෙන්කර දැක්විය යුතු ය. නියම කරනු ලැබූ අනුබෙදීම් ලැයිස්තුවහි R සලකුණ ඉහළම අගය ඇති මෙහෙයුම් ක්‍රමය ලෙස ප්‍රධාන මගී වින්‍යාසය ගනු ලැබිය යුතු ය.

(3) මේ එක් එක් පැටවුම් රේඛා සඳහා අනුරූපවන නැව් බඳේ ජලයෙන් පිටත ප්‍රදේශය, එකම ස්ථානයේ දී එකම නැව් තට්ටු රේඛාවකින්, තීරණය කරනු ලැබූ නැව් බඳේ ජලයෙන් පිටත ප්‍රදේශ වශයෙන් බලාත්මක බඩු බර රේඛා පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අනුකූලව මනිනු ලැබිය යුතු ය.

(4) එක් එක් අනුබෙදීම් පැටවුම් රේඛා සඳහා අනුරූපවන නැව් බඳේ ජලයෙන් පිටත ප්‍රදේශය සහ එය අනුමත කරන ලද සේවා වින්‍යාසය මගී නැව් ආරක්ෂක සහතිකයේ පැහැදිලිව දක්වනු ලැබිය යුතු ය.

(5) නැවේ ශක්තිය අනුව හෝ බලාත්මක පැටවුම් රේඛා පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය අනුව තීරණයවන පරිදි කිසිඳු අවස්ථාවක ලුණු වතුරේ ගැඹුරුම පැටවුම් රේඛාවට ඉහළින් යම් අනුබෙදීම් පැටවුම් රේඛා සලකුණක් තබනු නොලැබිය යුතු ය.

(6) අනුබෙදීම් බඩු බර සලකුණුවල ස්ථානය කුමක් විය හැකි වුව ද මගී නැවක්, බලාත්මක පැටවුම් රේඛා ජාත්‍යන්තර සම්මුතිය අනුව තීරණය වන පරිදි වාරයට සහ පිහිටි ප්‍රදේශයට අදාළ පැටවුම් රේඛා සලකුණ යටත්වන පරිදි කිසිඳු අවස්ථාවක දී බඩු පටවනු නොලැබිය යුතු ය.

(7) මගී නැවක් ලුණු වතුරේ දී නිශ්චිත මුහුදු ගමන සඳහා අදාළ අනුබෙදීම් පැටවුම් රේඛා සලකුණ සහ සේවා වින්‍යාසය යටත් කර ඇති විට කිසිඳු අවස්ථාවක දී එම මගී නැවෙහි එසේ බඩු පටවනු නොලැබිය යුතු ය.

## IV වන කොටස

*ස්ථායීතාවය කළමනාකරණය*

10.(1) සම්මුතියේ විස්තර කරන ලද නැවක් සම්බන්ධයෙන් එහි II-1 පරිච්ඡේදයේ ආ-4 කොටසෙහි නිශ්චිතව දක්වා ඇති ස්ථායිතා කළමනාකරණ නියම සමග නැවක් අනුකූල විය යුතු ය.

(2) එක් එක් නැව් තට්ටුව සම්බන්ධව සහ ජල පරිරෝධක කොටස්හි සීමා රැඳවුම් පැහැදිලිව ම පෙන්වන සැලසුම්, එහි යම් පාලකයන් වසා දැමීමේ හා ස්ථානගත කිරීමේ ක්‍රම සහිත එහි විවරයන් සහ ජල ගැලීම් හේතුවෙන් වන යම් පාලනයන් සකස් කිරීම සඳහාවන සැකසුම් නැව භාරව සිටින නිලධරයාගේ මග පෙන්වීම සඳහා නැවේ පාලන තට්ටුවේ ස්ථිර ලෙස ප්‍රදර්ශනය කිරීම කළ යුතු ය. නැතහොත් ඒවා පහසුවෙන් ලබාගත හැකි විය යුතු ය. ඊට අමතරව ඉහත සඳහන් තොරතුරු අඩංගු කුඩා පොත් නැවේ නිලධරයන් වෙත ලබා දෙනු ලැබිය යුතු ය.

(3) යාත්‍රා කරන කාලසීමාව තුළ විවෘත කර තැබීම සඳහා අවසර ලබාදෙනු ලැබූ මගී නැව්වල ජල පරිරෝධක ද්වාර පිළිබඳ ස්ථායිතා තොරතුරුවල පැහැදිලිව සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) සම්මුතියේ II-1 පරිච්ඡේදයේ ආ-1 කොටසේ හානි ස්ථායිතා නියම අදාළ වන නැව් සම්බන්ධයෙන්, නැවක කොටසක් හෝ කොටස් සමූහයක් සම්බන්ධ සියලු හානි අවස්ථාවන්හි දී නැවේ අතිජීවිතා පැවැත්ම තක්සේරු කිරීමේ සරල සහ පහසුවෙන් තේරුම්ගත හැකි ක්‍රමයක් හානි ස්ථායිතා තොරතුරු මගින් නාවික කපිතාන් සපයනු ලැබිය යුතු ය.

## V වන කොටස

*යන්ත්‍ර සූත්‍ර සහ විද්‍යුත් සවි කිරීම්*

11. සම්මුතියේ විස්තර කරන ලද නැවක් සම්බන්ධයෙන් එහි II-1 පරිච්ඡේදයෙහි ඇ කොටසේ නිශ්චිතව සඳහන් -

(අ) නැව්වල යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් සහ උපකරණ.

(ආ) මෙහෙයුම් සහ නඩත්තු උපදෙස් සහ නැව්වල යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා වන ඉංජිනේරු සැලසුම්,

සම්බන්ධයෙන් අදාළ වන නියම සමග නැවක් අනුකූල විය යුතු ය.

12. සම්මුතියේ විස්තර කරන ලද නැවක් සම්බන්ධයෙන් එහි II-1 පරිච්ඡේදයේ ඈ කොටසේ නිශ්චිතව සඳහන් නැව්වල විද්‍යුත් සවිකිරීම් සම්බන්ධයෙන් අදාළ වන නියම සමග නැවක් අනුකූල විය යුතු ය.

## VI වන කොටස

*වරින් වර භාවිත නොකළ යන්ත්‍ර සූත්‍ර අවකාශයන් සඳහා වන අතිරේක නියම*

13. (1) සම්මුතියේ II-1 පරිච්ඡේදයේ ඉ කොටසේ නියෝගයන්හි නිශ්චිතව සඳහන් කර ඇති වරින් වර භාවිත නොකළ යන්ත්‍ර සූත්‍ර අවකාශයන් සම්බන්ධයෙන් අදාළ වන නියම සමග වරින් වර භාවිත නොකළ යන්ත්‍ර සූත්‍ර අවකාශයන් ඇති භාණ්ඩ නැවක් සමග අනුකූල විය යුතු ය.

(2) මගී නැවක යන්ත්‍ර සූත්‍ර අවකාශ වරින් වර භාවිත කළ හැකි ද නැද්ද යන්න පිළිබඳව සහ එසේ භාවිත කළ හැකි නම් සාමාන්‍යයෙන් භාවිත කරන යන්ත්‍ර සූත්‍ර අවකාශයන් හා සමාන ආරක්ෂාවක් ඒ සඳහා ලබා ගැනීමට මේ නියෝගයන්හි සඳහන් කරනු ලැබූ අතිරේක නියම අවශ්‍ය වන්නේ ද යන්න පිළිබඳව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, විශේෂයෙන් සලකා බලනු ලැබිය යුතු ය. එකී නියම, ක්‍රියාත්මක කිරීමේ සම්මත ලෙස ලබා දෙනු ලැබේ.

## VII වන කොටස

*විකල්ප සැලසුම් සහ වැඩපිළිවෙළ*

14. (1) විකල්ප සැලසුම් සහ වැඩපිළිවෙළ අදාළ නියමයන්හි අභිප්‍රාය සපුරාලීම සහ සම්මුතියේ II-1 වන පරිච්ඡේදයට සමාන මට්ටමේ ආරක්ෂාවක් සැපයීම සිදු කරනු ලැබූව ද, යන්ත්‍ර සූත්‍ර, විද්‍යුත් සවිකිරීම සහ අඩු ජ්වලන අංක සහිත ඉන්ධන ගබඩා කිරීමේ සහ බෙදා හැරීමේ සැලසුම සහ වැඩපිළිවෙළ, සම්මුතියේ II-1 වන පරිච්ඡේදයේ ඇ, ඈ, ඉ හෝ උ කොටස්වල දක්වා ඇති නියමවලින් බැහැර විය හැකි ය.

(2) විකල්ප සැලසුම් හෝ වැඩ පිළිවෙළ ඇ, ඈ, ඉ හෝ උ කොටස්වල නිර්දේශක නියමවලින් බැහැර වන විට, ඉංජිනේරු විශ්ලේෂණයක්, ඇගයීමක් සහ සැලසුම් සහ වැඩපිළිවෙළ පිළිබඳ අනුමතයක් සම්මුතියේ II-1 වන පරිච්ඡේදයේ 55 වන නියෝගයට අනුව සිදු කරනු ලැබිය යුතු ය.

(3) සියලු ගිවිසුම්ගත රජයන් වෙත අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරන ලද විකල්ප සැලසුම් සහ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් අදාළ තොරතුරු බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා සංවිධානය වෙත දැනුම් දිය යුතු ය.

## VIII වන කොටස

*අඩු ජ්වලන අංක සහිත ඉන්ධන භාවිත කරන නැව්*

15. (1) (4) වන සහ (5) වන අනු නියෝගයන්හි සඳහන් කර ඇති පරිදි හැර, මේ කොටස-

(අ) 2017 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ඇතිකර ගනු ලැබූ ඉදි කිරීම් ගිවිසුම් සඳහා;

(ආ) ඉදි කිරීම් ගිවිසුමක් නොමැති විට දී, 2017 ජූලි මස 1 වන දින හෝ ඉන්පසු නැව්තලය තනනු ලැබූ හෝ ඒ හා සමාන ඉදිකිරීම් පවතින අවස්ථාවක;හෝ

(ඇ) 2021 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු භාරදෙන,

අඩු ජ්වලන අංකයක් සහිත ඉන්ධන භාවිත කරන එකී නැව් සම්මුතියේ වන වෙනත් යම් අදාළ නියමයන්ට අමතරව මේ කොටසේ නියමයන් සමග අනුකූල විය යුතු ය.

(2) (4) වන සහ (5) වන අනු නියෝගයන්හි සඳහන් කර ඇති පරිදි හැර, 2009 ජනවාරි මස 1 වන දිනට පෙර ඉදි කරනු ලැබූ නැවක් ඇතුළුව නැව ඉදි කිරීමේ දිනය නොතකා, 2017 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු, අඩු ජ්වලන අංකයක් සහිත ඉන්ධන භාවිත කිරීම සඳහා මාරු කරන නැවක්, එකී මාරු කිරීම ආරම්භ වූ දින සිට, අඩු ජ්වලන අංකයක් සහිත ඉන්ධන භාවිත කරන නැවක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) (4) වන සහ (5) වන අනු නියෝගයන්හි සඳහන් කර ඇති පරිදි හැර, 2009 ජනවාරි මස 1 වන දිනට පෙර ඉදි කරනු ලැබූ නැවක් ඇතුළුව නැව ඉදි කිරීමේ දිනය නොතකා, 2017 ජනවාරි මස 1 වන දිනට පෙර මුලින් අනුමත කරන ලද ඉන්ධ-නවලට වඩා වෙනස් වූ අඩු ජ්වලන අංක සහිත ඉන්ධන භාවිත කිරීම සඳහා 2017 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු සිට කටයුතු කරන අඩු ජ්වලන අංක සහිත ඉන්ධන භාවිත කරන නැවක්, එකී කටයුත්ත ආරම්භ කළ දින සිට අඩු ජ්වලන අංකයක් සහිත ඉන්ධන භාවිත කරන නැවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සම්මුතියේ VII වන පරිච්ඡේදයේ නිර්වචනය කර ඇති පරිදි, මෙම කොටස ;

(අ) එහි ඇති භාණ්ඩ ඉන්ධන ලෙස භාවිත කර සම්මුතියේ VII වන පරිච්ඡේදයේ නිර්වචනය කර ඇති පරිදි IGC සංග්‍රහයේ නියමයන්ට අනුකූලව කටයුතු කරන; හෝ

(ආ) වෙනත් යම් අඩු ජ්වලන අංකයක් සහිත වායුමය ඉන්ධන සඳහා ඉන්ධන ගබඩා කිරීම සහ බෙදා හැරීමේ පද්ධති සැලසුම් සහ සැකසුම් සිදු කරන IGC සංග්‍රහයේ භාණ්ඩයක් වශයෙන් වායු සඳහා වන නියමයන්ට අනුකූලව කටයුතු කරන වෙනත් අඩු ජ්වලන අංකයක් සහිත වායු ඉන්ධන භාවිත කරන,

වායු ප්‍රවාහක සඳහා අදාළ නොවිය යුතු ය.

(5) මේ කොටස, ගිවිසුම්ගත රජයක් සතු හෝ ගිවිසුම්ගත රජයක් විසින් ක්‍රියාත්මක කරන සහ රජයේ වානිජමය නොවන සේවාවල දී පමණක් තත්කාලීනව භාවිත කරනු ලබන නැව් සඳහා අදාළ නොවිය යුතු ය. එසේ වුවද, ගිවිසුම් ගත රජයක් සතු හෝ ගිවිසුම්ගත රජයක් විසින් ක්‍රියාත්මක කරන සහ රජයේ වානිජමය නොවන සේවාවල දී පමණක් තත්කාලයෙහි භාවිත කරන නැව් මේ කොටස සමග සාධාරණ සහ ප්‍රායෝගික තාක්ෂණයට ඊට අනුකූල වන ආකාරයෙන් කටයුතු කිරීම සඳහා දිරිමත් කරනු ලැබේ.

16. 15 (4) වන සහ 15(5) වන නියෝගයන්හි දක්වා ඇති පරිදි හැර, අඩු ජ්වලන අංකයක් සහිත ඉන්ධන භාවිත කරන නැව් IGF සංග්‍රහයේ නියමයන් සමග අනුකූලව කටයුතු කළ යුතු ය.

## *IX වන කොටස*

*සාමාන්‍ය විධිවිධාන*

17. පරිපාලන පිළිබඳ සෑහීමට පත්වීම සඳහා සම්මුතියේ II-1 වන පරිච්ඡේදයේ සඳහන් කිරීම් සිදු කර ඇති විට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති හරහා එකී සඳහන් කිරීම් සඳහා ඍජු අර්ථකතන සපයා නොමැති අවස්ථා සම්බන්ධ අවස්ථාවල දී, වර්ගීකරණ සමිති පිළිබඳ ජාත්‍යන්තර සංගමයේ එකීය අර්ථ නිරූපණය, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අර්ථ නිරූපණය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

18. පිළිගත් සංවිධානයක් හෝ එක්සත් ජනපද වෙරළා රක්ෂකයා විසින්, එක්සත් රාජධානියේ සමුද්‍රීය වෙරළාරක්ෂක නියෝජ්‍යායතනය හෝ ජපානයේ සමුද්‍රීය පරිපාලනය විසින් ප්‍රදානය කරනු ලැබූ උපකරණ අනුමතයන් අධ්‍යක්ෂ ජනරාල්වරයා පිළිගන්නා අතර එකී අනුමතයන් සම්මුතියේ නියමයන් සමග සම්පූර්ණයෙන් අනුකූල වන බව දක්වනු ලැබේ. තවද යුරෝපීය සංගමයේ සමුද්‍ර උපකරණ විධානවල සහතික කිරීමේ කාර්ය පටිපාටිය යටතේ අනුමත කර ඇති උපකරණ ද අධ්‍යක්ෂ ජනරාල්වරයා පිළිගනු ලබයි.

19. ශ්‍රී ලංකාවේ පිහිටි යම් වරායක හෝ යම් ස්ථානයක ඇති යම් නැවක් අනාරක්ෂිත නැවක් ලෙස හඳුනාගනු ලබන අවස්ථාවක දී එනම් එවැනි නැවක නැව් බඳේ, උපකරණවල, යන්ත්‍ර සූත්‍රවල දෝෂ සහගත තත්ත්වයක්, සේවක පිරිස අඩු බව, අධිකව පැටවීම හෝ නුසුදුසු පැටවීම හෝ සම්මුතිය සමග අනුකූල නොවන වෙනත් යම් තත්ත්වයක් හේතුවෙන් එකී නැව සිදු කිරීමට අදහස් කරන සේවයේ ස්වභාවය අනුව මිනිස් ජීවිතවලට බරපතල හානි සිදු නොකරමින් මුහුදට ගමන් කිරීමට නොහැකි වන යම් අවස්ථාවක දී, එහි දෝෂ සහගත තත්ත්වය සමීක්ෂණය කිරීමේ හෝ එම දෝෂය නිවැරදි කිරීමේ කාර්යය සඳහා එකී නැව තාවකාලිකව රඳවා තබා ගනු ලැබිය හැකි ය.

20. සම්මුතියෙහිII-1 වන පරිච්ඡේදයේ පාදක සටහන් සහ එකී පාදක සටහන්හි සඳහන් කරනු ලැබූ යෝජනා සම්මත, චක්‍රලේඛ හෝ ලේඛන, මේ නියෝගයන්හි කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

21. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අමාත්‍යවරයාගේ, එකඟත්වය ඇතිව, මේ නියෝගයන්හි විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, සම්මුතියේ හෝ 1988 ප්‍රොටොකෝලයේ විධිවිධානයන්හි අවම තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

22. මේ නියෝගයන් හි,

"භාණ්ඩ නැව" යන්නෙන්, මගී නැවක් නොවන යම් නැවක් අදහස් වේ;

"සම්මුතිය" යන්නෙන්, 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය, කලින් කල සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන සංශෝධන අදහස් වේ;

"වායු ප්‍රවාහක" යන්නෙන්, ජාත්‍යන්තර වායු ප්‍රවාහක සංග්‍රහයේ 19 වන පරිච්ඡේදයේ ලයිස්තු කරන ලද යම් ද්‍රවීකරණය කළ වායු හෝ වෙනත් නිෂ්පාදන තොග වශයෙන් ප්‍රවාහනය කිරීම සඳහා ඉදිකර හෝ සකස් කර භාවිත කරනු ලැබූ භාණ්ඩ නැවක් අදහස් වේ;

"IGC සංග්‍රහය" යන්නෙන්, ද්‍රවීකරණ කළ වායු තොග වශයෙන් ප්‍රවාහනය කරන නැව් ඉදිකිරීම සහ සම්පාදනය කිරීම සඳහා වන ජාත්‍යන්තර සංග්‍රහය අදහස් වේ;

"IGF සංග්‍රහය" යන්නෙන්, වායු හෝ වෙනත් අඩු ජ්වලන අංකයක් සහිත ඉන්ධන භාවිත කරන නැව් සඳහා වන ජාත්‍යන්තර ආරක්ෂණ සංග්‍රහය අදහස් වේ;

"IMO" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ;

"දිග (L)" යන්නෙන්, බලාත්මක පැටවුම් රේඛා පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ නිර්වචනය කර ඇති පරිදි දිග අදහස් වේ;

"අඩු ජ්වලන අංකයක් සහිත ඉන්ධන" යන්නෙන්, සම්මුතියේ II-2 වන පරිච්ඡේදයේ 4.2.1.1 නියෝගය යටතේ අවසර ලබාදී ඇති ප්‍රමාණයට වඩා අඩු ජ්වලන අංකයක් සහිත වායුමය හෝ ද්‍රවමය ඉන්ධන අදහස් වේ;

"යන්ත්‍ර සූත්‍ර අවකාශ" යන්නෙන්, ප්‍රචාලන මූලිකව ම අරමුණු කරගත් බොයිලේරු, ජෙනරේටර සහ විදුලි මෝටර ඇතුළු, ප්‍රධාන සහ අතිරේක ප්‍රචාලන යන්ත්‍ර සූත්‍ර අඩංගු අවකාශයක ජල පරිරෝධක සීමා අතර වන අවකාශයන් අදහස් වේ. විශේෂ සැකසුම් සම්බන්ධයෙන් වන විට දී අධ්‍යක්ෂ ජනරාල්වරයා යන්ත්‍ර සූත්‍ර අවකාශවල සීමා නිර්වචනය කළ හැකි ය.

"සංවිධානය" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ.

"මගී නැව" යන්නෙන්, මගීන් දොළොස් දෙනෙකුට වැඩි ප්‍රමාණයක් ගෙන යන නැවක් අදහස් වේ.

"පිළිගත් සංවිධානය" යන්නෙන්, සංවිධානය විසින් සම්මත කරන ලද "පිළිගත් සංවිධාන සඳහා වන සංග්‍රහයේ" විධිවිධානයන්ට අනුකූලව පිළිගෙන ඇති සංවිධානයක් අදහස් වේ.

"ජල පරිරෝධකභාවය" යන්නෙන්, නිරුපද්‍රිත සහ හානියට පත් තත්ත්වයන් තුළ ජල ශීර්ෂ යටතේ යම් දිශාවකින් සිදු විය හැකි ජලයගලා ඒම වැළැක්විය හැකි ව්‍යුහයක කොටස් සඳහා සම්මත මාන සහ සැලසුම් තිබීම අදහස් වේ. හානියට පත් තත්ත්වයක දී ජල ගැලීමේ අතරමැදි අවස්ථා ඇතුළුව, ජල ශීර්ෂයටපත්ව ඇති සමතුලිතතාවයේ දරුණුතම අවස්ථාව සලකනු ලැබිය යුතු ය.

"කාලගුණ පරිරෝධක භාවය" යන්නෙන්, කිසිදු මුහුදු තත්ත්වයක දී ජලය නැව තුළට ඇතුළු නොවන බව අදහස් වේ.

"2008 IS සංග්‍රහය" යන්නෙන්, 2008, නිරුපද්‍රිත ස්ථාවරත්වය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය අදහස් වේ.

ECG 01-0242

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.